# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2026.03.31 පැය 0540 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/538/2026 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.**

**பொலிஸ் ஊடகப் பிரிவிற்கு அறியத்தரப்பட்ட முக்கிய தகவல்கள்**

## 01. සැකකටයුතු මරණයක් - කහවත්ත පොලිස් වසම.

2026.03.30 දින කහවත්ත පොලිස් වසමේ කහවත්තකන්ද ප්‍රදේශයේ පතල් වළක නාඳුනන පිරිමි මෘත ශරීරයක් ඇති බවට ලද තොරතුරක් මත කහවත්ත පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක් වූ ලෙනදොර ප්‍රදේශයේ පදිංචි මැණික් ව්‍යාපර කටයුතු වල නිරත පුද්ගලයෙකු බවට අනාවරණය කරගෙන ඇත.**

2026.03.28 දින ඕපනායක පොලිස් වසමේ ලෙන්දර ප්‍රදේශයේ පුද්ගලයෙකු අතුරුදන් වීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඕපනායක පොලිස් ස්ථානයට වාර්තා වී තිබූ අතර මෙම මරණකරු ඉහත අතුරුදන් වූ පුද්ගලයා බවට අනාවරණය වී ඇත.

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කිරීමෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කහවත්ත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කහවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## சந்தேகத்திற்கிடமான மரணம் – கஹவத்த பொலிஸ் பிரிவு

*2026.03.30 அன்று கஹவத்த பொலிஸ் பிரிவின் கஹவத்தகந்த பகுதியில் உள்ள சுரங்கக் குழியில் அடையாளம் தெரியாத ஆண் ஒருவரின் சடலம் இருப்பதாக கிடைத்த தகவலின் அடிப்படையில் கஹவத்த பொலிஸார் விசாரணைகளை ஆரம்பித்துள்ளனர்.*

*பின்னர், உயிரிழந்தவர் 61 வயதுடைய லெனதொர பகுதியைச் சேர்ந்த இரத்தின கல் வர்த்தகத்தில் ஈடுபட்டிருந்த நபர் என அடையாளம் காணப்பட்டுள்ளார்.*

*2026.03.28 அன்று ஓப்பநாயக்க பொலிஸ் பிரிவில் லெனதொர பகுதியில் ஒருவர் காணாமல் போனதாக பதிவு செய்யப்பட்டிருந்தது. அந்த காணாமல் போன நபரே இவ்வாறு உயிரிழந்துள்ளதாக உறுதிப்படுத்தப்பட்டுள்ளது.*

மரணத்திற்கான நீதிமன்ற விசாரணைக்குப் பின்னர் உடல் பிரேத பரிசோதனைக்காக களுவத்த வைத்தியசாலையில் வைக்கப்பட்டுள்ளது. மேலதிக விசாரணைகள் நடைபெற்று வருகின்றன.

**02.** **කාන්තාවක් පාලු ළිඳකට දමා ඝාතනය කර තවත් කාන්තාවක් ඝාතනය කිරීමට තැත් කිරීමේ අපරාධයට අදාලව තවත් සැකකරුවෙකු අත්අඩංගුවට - කොක්කඩිචෝල පොලිස් වසම.**

2026.03.20 දින කොක්කඩිචෝල පොලිස් ස්ථානයට වාර්තා වූ පාලු ළිඳකට දමා තිබියදී හමුවූ කාන්තා මළ සිරුරක් හමු වීම හා එහි සිටි තවත් කාන්තාවකගේ දිවි බේරා ගැනීමේ සිද්ධියට අදාලව වැඩිදුර විමර්ශන නැගෙනහිර පළාත් අපරාධ කොට්ඨාසය විසින් සිදු කරගෙන යනු ලබයි.

දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වූ තොරතුරු මත 2026.03.29 දින මෙම ඝාතනයට ආධාර අනුබල දුන් තවත් සැකකරුවෙකු වත්තල පොලිස් වසමේදී නැගෙනහිර පළාත් අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන කොක්කොඩිචෝල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 49 ක් වන වත්තල ප්‍රදේශයේ ඖෂධහල් හිමිකරුවෙකි.**

අත්අඩංගුවට ගන්නාලද සැකකරු 2026.03.30 දින මඩකලපුව ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ලබා ගන්නා ලද දින 03 ක රැඳවුම් නියෝග මත වැඩිදුර විමර්ශන කොක්කඩිචෝල පොලිස් ස්ථානය විසින් සිදු කරනු ලබයි.

**பெண்ணை கிணற்றில் தள்ளி கொலை செய்ததும் மற்றொருவரை கொல்ல முயன்ற சம்பவம் – மேலும் ஒருவர் கைது (கொக்கடிச்சோலை பொலிஸ் பிரிவு)**

2026.03.20 அன்று கொக்கடிச்சோலை பகுதியில் கிணற்றில் இருந்து பெண் சடலம் மீட்கப்பட்டதும் மற்றொரு பெண் உயிர் காப்பாற்றப்பட்டதும் தொடர்பாக கிழக்கு மாகாண குற்றப்பிரிவு விசாரணைகள் மேற்கொண்டு வருகிறது.

இந்த விசாரணையின் அடிப்படையில் 2026.03.29 அன்று, குற்றத்திற்கு உதவி செய்ததாக சந்தேகிக்கப்படும் ஒருவர் வத்தளை பகுதியில் கைது செய்யப்பட்டு கொக்கடிச்சோலை பொலிஸாரிடம் ஒப்படைக்கப்பட்டார்.

சந்தேகநபர் 49 வயதுடைய மருந்தகம் உரிமையாளர் ஆவார்.

அவர் 2026.03.30 அன்று மட்டக்களப்பு நீதிமன்றத்தில் ஆஜர்படுத்தப்பட்டு 03 நாள் தடுப்புக் காவலில் வைத்து மேலதிக விசாரணைகள் மேற்கொள்ளப்படுகின்றன.

**03.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස් ස්ථානය.**

2026.03.30 දින රාත්‍රී කාලයේ දිවුලපිටිය පොලිස් වසමේ දූනගහ ප්‍රදේශයේදී දිවුලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 100 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 24 ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දිවුලපිටිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**ஐஸ் போதைப்பொருளுடன் நபர் கைது – திவுலபிட்டிய பொலிஸ் நிலையம்**

2026.03.30 அன்று இரவு, திவுலபிட்டிய பொலிஸ் பிரிவின் தூனகஹ பகுதியில் நடத்தப்பட்ட சோதனையில் 100 கிராம் ஐஸ் போதைப்பொருளுடன் ஒருவர் கைது செய்யப்பட்டார்.

சந்தேகநபர் 24 வயதுடைய ஹோமாகம பகுதியைச் சேர்ந்தவர்.

**04.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ දිසා අපරාධ කොට්ඨාසය.**

2026.03.30 දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ කජීමාවත්ත ප්‍රදේශයේදී කොළඹ දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 18 මිලිග්‍රෑම් 200 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 47 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ දිසා අපරාධ කොට්ඨාසය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**ஐஸ் போதைப்பொருளுடன் நபர் கைது – கொழும்பு மாவட்ட குற்றப்பிரிவு**

2026.03.30 அன்று இரவு, கிராண்ட் பாஸ் பொலிஸ் பிரிவின் கஜீமாவத்த பகுதியில் நடத்தப்பட்ட சோதனையில் 18 கிராம் 200 மில்லிகிராம் ஐஸ் போதைப்பொருளுடன் ஒருவர் கைது செய்யப்பட்டார்.

சந்தேகநபர் 47 வயதுடைய கொழும்பு 15 பகுதியைச் சேர்ந்தவர்.

**05.** **නීති විරෝධි මත්පැන් පෙරීමට යොදාගනු ලබන ගෝඩා තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහරක ඒකකය.**

2026.03.30 දින සවස් කාලයේ වාද්දුව පොලිස් වසමේ පොතුපිටිය ප්‍රදේශයේදී වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහරක ඒකකයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1134 (බැරල් 06) ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාද්දුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 25 ක් වන පොතුපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාද්දූව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**சட்டவிரோத மது தயாரிக்க பயன்படுத்தப்படும் கோடாவுடன் நபர் கைது – வலான மத்திய ஊழல் ஒழிப்பு பிரிவு**

2026.03.30 அன்று மாலை, வாத்துவ பொலிஸ் பிரிவின் பொத்துப்பிட்டிய பகுதியில் நடத்தப்பட்ட சோதனையில்:

- கோடா – 1134 லிட்டர் (06 பேரல்கள்)

இவற்றுடன் ஒருவர் கைது செய்யப்பட்டு வாத்துவ பொலிஸாரிடம் ஒப்படைக்கப்பட்டார்.

சந்தேகநபர் 25 வயதுடைய பொத்துப்பிட்டிய பகுதியைச் சேர்ந்தவர்.

**06. බස් රථයක පදිකයෙකු ගැටී ජීවිතක්ෂයට - කෑගල්ල පොලිස් වසම.**

2026.03.30 දින රත්‍රී කාලයේ කෑගල්ල පොලිස් වසමේ මොලගොඩ ප්‍රදේශයේදී කෑගල්ල කොළඹ මාර්ගයේ කොළඹ දෙස සිට මහනුවර දෙසට ධාවනය වෙමින් තිබූ පුද්ගලික බස් රථයක මාර්ග හරහා ගමන් කල පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදිකයා තුවාල ලබා කෑගල්ල රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ මොලගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ බස් රථ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කෑගල්ල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

**பேருந்து மோதியதில் பாதசாரி உயிரிழப்பு – கேகாலை பொலிஸ் பிரிவு**

2026.03.30 அன்று இரவு, கேகாலை – கொழும்பு வீதியில் மொல்கொட பகுதியில், கொழும்பு இருந்து கண்டி நோக்கிச் சென்ற தனியார் பேருந்து, சாலை கடந்து சென்ற பாதசாரியை மோதியது.

இந்த விபத்தில் காயமடைந்த பாதசாரி கேகாலை வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டபின் உயிரிழந்தார்.

உயிரிழந்தவர் 54 வயதுடைய மொல்கொட பகுதியைச் சேர்ந்தவர்.

சம்பவத்துடன் தொடர்புடைய பேருந்து ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார். மேலதிக விசாரணைகள் நடைபெற்று வருகின்றன.

**பொலிஸ் ஊடகப் பிரிவு**